| | |
|---|---|
| | **ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය** |
| | **පුරප්පාඩු** |

පහත සඳහන් පුරප්පාඩු සඳහා ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය විසින් සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් **2018.08.07** දින දක්වා අයදුම්පත් භාරගනු ලැබේ.

## ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී (නෛතික හා ප්‍රලේඛන)

### සුදුසුකම්

01. පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උසස් අධ්‍යාපන ආයතනයකින් මූලික නීති උපාධියක් ලබා ඉන් පසුව නීතිඥවරයකු ලෙස රාජ්‍ය හෝ පෞද්ගලික අංශයේ පිළිගත් ආයතනයක උසාවි කටයුතු, නීති කටයුතු හා නෛතික ලියවිලි සකස් කිරීම පිළිබඳ අවම වසර පහක (05) පලපුරුද්දක් ලත් නීතිඥවරයකු.

**හෝ**

02. නීතිඥවරයකු ලෙස, රාජ්‍ය හෝ පෞද්ගලික අංශයේ පිළිගත් ආයතනයක උසාවි කටයුතු පිළිබඳ, නීති කටයුතු හා නෛතික ලියවිලි සකස් කිරීම පිළිබඳ අවම වසර දහයක (10) පලපුරුද්දක් ලත් නීතිඥවරයකු.

### වැටුප් පරිමාණය

[U-EX 2(II)]
Rs. 66,180 - 8x 1,335: 8 x 1,630 - 89,900p.m. as at 01.01.2020

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 2016/17 (V) අනුව ඉහත වැටුප් පරිමාණයන් පියවර 5කින් 2016 සිට 2020 දක්වා ක්‍රියාත්මක කරනු ලැබේ. සම්පූර්ණ වැටුප් පරිමාණය 2020 සිට බලපැවැත්වෙනු ඇත.

ඒ අනුව 2018 වර්ෂයේ ආරම්භක වැටුප් පියවර රු: 52,814.00ක් වේ. (මෙම වැටුපට අමතරව රජය විසින් අනුමත කරන ලද අනෙකුත් දීමනා ද ගෙවනු ලැබේ)

### බඳවා ගැනීමේ ක්‍රමවේදය :

ව්‍යුහාත්මක සම්මුඛ පරීක්ෂණයක් මගින්, ව්‍යුහාත්මක සම්මුඛ පරීක්ෂණය සඳහා ලබා ගත් ලකුණු ප්‍රමාණය 40% හෝ ඊට වැඩි අයදුම්කරුවන් තෝරා ගැනීමට සලකා බලනු ඇත.

### වැදගත් :

පලපුරුද්ද යනු රාජ්‍ය හෝ පෞද්ගලික අංශයේ පිළිගත් ආයතනයක උසාවි/ නීති කටයුතු හැසිරවීමට හා නෛතික ලියවිලි සකස් කිරීමට විධායක මට්ටමේ ලබාගත් පලපුරුද්දයි.

**ප්‍රතිලාභ**

තෝරාගනු ලබන අයදුම්කරුවන් ඔවුන්ගේ මාසික වැටුපෙන් 10% විශ්වවිද්‍යාලය අර්ථ සාධක අරමුදලට දායක විය යුතුය. විශ්වවිද්‍යාලය විසින් සේවකයාගේ වැටුපෙන් 15% ක දායකත්වයක් දරන අතර ඉන් 8% ක් විශ්වවිද්‍යාල විශ්‍රාම අරමුදලටද, 7% ක් විශ්වවිද්‍යාලය අර්ථ සාධක අරමුදලටද දායක කරනු ලබයි. මීට අමතරව සේවා නියුක්තයන්ගේ භාර අරමුදලට විශ්වවිද්‍යාලය විසින් සේවකයාගේ වැටුපෙන් 3% ක් දායක කරනු ලැබේ.

ජ්‍යෙෂ්ඨ පාලන නිළධාරීන් සඳහා සප්තවාර්ෂික නිවාඩු සඳහා අවුරුදු 7ක සේවා කාලකින් පසුව වසරක වැටුප් සහිත නිවාඩු හෝ වසර 2ක වැටුප් රහිත නිවාඩු සඳහා හිමිකම් ලබන අතර ඉහත නිවාඩුව තුල විදේශ ගත වන නිළධාරියාට හා කලත්‍රයාට සම්පූර්ණ ගුවන් ටිකට්පත් ලබා දෙනු ලැබේ.

**අයදුම්පත් හා විස්තර**

අයදුම්පත්, අවශ්‍ය සුදුසුකම් හා වෙනත් තොරතුරු විශ්වවිද්‍යාලයේ වෙබ් අඩවියවන www.seu.ac.lk යන ලිපිනයෙන් ලබා ගත හැක. අයදුම්පත සමග මහජන බැංකුවේ ඕනෑම ශාඛාවකට ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයේ ගිණුම් අංක 228-1001-9000-1704 අඩ්ඩාලච්චේන යන ගිණුමට රු: 200.00 ගෙවූ එම රිසිට් පත ඇමිණිය යුතුයි.

නිසි පරිදි පුරවන ලද අයදුම්පත, සහතිකපත් වල පිටපත් සහිතව ලියාපදිංචි තැපැලෙන් Registrar, South Eastern University of Sri Lanka, University Park, Oluvil #32360 යන ලිපිනයට **2018.08.07** දිනට හෝ ඊට පෙර ලැබෙන සේ එවිය යුතුය. අයදුම්කරන තනතුර ලිපි කවරයේ වම් පස ඉහල කෙලවරේ සඳහන් කළ යුතුයි.

රජයේ දෙපාර්තමෙන්තු, සංස්ථා හා වෙනත් රජයේ ආයතන වල සේවය කරන අයදුම්කරුවන් තමන්ගේ අයදුම්පත ආයතනයේ ප්‍රධානියා මගින් එවීම අනිවාර්ය වේ. එසේ නමුත් මූලික පිටපතක් ප්‍රථමයෙන් එවීමට හැකියාව ඇති අතර එසේ එවන ලද මූලික පිටපත් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීමට සලකා බලනු නොලැබේ. අයදුම්කරු විසින් අදාල ආයතන ප්‍රධානියා හරහා නියමිත මාර්ගයෙන් නොඑවන ලද කිසිදු අයදුම්පතක් විශ්වවිද්‍යාලය විසින් සලකා බලනු නොලැබේ.

අසම්පූර්ණ, අපැහැදිළි හා අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් තොරාගැනීමේ බලය අග්නිදිග විශ්වවිද්‍යාලය සතුය. අයදුම්පත් මගින් තෝරා ගනු ලබන අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබනු ඇත.

ලේඛකාධිකාරී
ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය
විශ්වවිද්‍යාල උයන
ඔලුවිල් - 32360
04.07.2018